# ජාතික ඖෂධ නියාමන අධිකාරිය

# තනතුරු පුරප්පාඩු

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම තනතුරු ස්ථිර, සේවක අර්ථ සාධක අරමුදලට දායකත්වය දරන තනතුරක් වන අතර ස්ථාන මාරු වීම් රහිත වේ.

**අභ්‍යන්තර විගණන තනතුර : (පුරප්පාඩු ගණන 01 යි)**

වාර්ෂික විගණන සැලැස්ම, විගණන වැඩසටහන් පිළියෙළ කිරීම හා කළමනාකරණයට ඉදිරිපත් කිරීම / වැඩ සුපරීක්ෂණය, අභ්‍යන්තර පාලන ක්‍රම හඳුන්වා දීම, කළමනාකරණ වාර්තා පිළියෙළ කිරීම, කාර්ය සාධන වාර්තා වාර්ෂික වාර්තා ආදිය පිළියෙළ කිරීම / ආයතනයේ හා අමාත්‍යංශයේ කළමනාකරණ කමිටුවලට සහභාගී වීම හා කමිටු වාර්තා නිර්දේශ කිරීමට සහය වීම / රජයේ විගණන වාර්තාවලට පිළිතුරු ලිවීමට අදාළ අංශ පෙළඹවීම හා යාවත්කාලීන කිරීම / විගණන කමිටු විමර්ශනයන් සඳහා කැඳවුම්කරුවෙකු ලෙස කටයුතු කිරීම / කෝප් රැස්වීමේ නිර්දේශ කළ වාර්තා අදාළ අංශ මගින් සකස් කිරීමට සහය වීම / කළමනාකරණය විසින් පවරන ලද විශේෂ විගණනයන් හා විමර්ශනයන් සිදු කිරීම තනතුරට පැවරෙන කාර්යයන් වේ.

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් කළමනාකරණය, ගණකාධිකරණය හෝ වාණිජ්‍යය ක්ෂේත්‍රයෙහි උපාධියක්

හෝ

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම.

සහ

ඉහත සුදුසුකම ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, රාජ්‍ය මණ්ඩලයක, හෝ පිළිගත හැකි ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන්

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

**වයස :** අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**තනතුරට අදාළ වැටුප් පියවර :** කළමනාකරණ චක්‍රලේඛ 02/2016 පරිදි MM 1-1 රු. (53,175-10X1,375-15X1,910 - 95,575/-) වැටුප් පරිමාණයේ 2020-01-01 දිනට හිමි වැටුප් පියවර වන රු. 53,175/- හා අනුමත දීමනා.

**බඳවා ගැනීමේ ක්‍රමය :** විවෘත තරග විභාගයක් හා / හෝ පත්වීම් බලධරයා විසින් පත් කෙරෙන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීමෙනි.

**වෙනත් කරුණු :**

සෑම ඉල්ලුම්කරුවක් ම,

i. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

- රාජ්‍ය, අර්ධ රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් යොමු කළ යුතුය.

නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2021-06-19 දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ hrdirector@nmra.gov.lk යන විද්‍යුත් ලිපිනයට ඊ-මේල් කිරීම මගින් හෝ ප්‍රධාන විධායක නිලධාරී, ජාතික ඖෂධ නියාමන අධිකාරිය, අංක 120, නොරිස් කැනල් පාර, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ යොමු කළ යුතුය. ඊමේල් මගින් යොමු කිරීමේදී විෂය ලෙසද, තැපැල් කිරීමේදී ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි ද අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

**සභාපති,**

**ජාතික ඖෂධ නියාමන අධිකාරිය.**

## ජාතික ඖෂධ නියාමන අධිකාරිය

## .......................... තනතුර සඳහා අයදුම්පත

1. සම්පූර්ණ නම :
2. මුලකුරු සමග නම :
3. ලිපිනය :
4. පදිංචි දිස්ත්‍රික්කය :
5. උපන් දිනය :
6. වයස : අවු : ................................ මාස : ................................ දින : ................................
7. ස්ත්‍රී / පුරුෂ භාවය :
8. ජාතික හැඳුනුම්පත් අංකය :
9. විභාගයට පෙනී සිටින මාධ්‍යය :
10. දුරකථන අංකය : ස්ථාවර : ................................ ජංගම : ................................
11. විද්‍යුත් තැපැල : ................................
12. අධ්‍යාපන සුදුසුකම් :
13. වෘත්තීය සුදුසුකම් :
14. පළපුරුද්ද :
15. අයදුම්කරු පිළිබඳ තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ නම්, දුරකථන අංක හා ලිපිනයන් :

මෙහි ඉහතින් දක්වා ඇති මා පිළිබඳ තොරතුරු මාගේ දැනීම, විශ්වාසය අනුව නිවැරදි හා සත්‍ය බව ප්‍රකාශ කරමි.

දිනය : ..............................................

(ඉල්ලුම්කරුගේ අත්සන)

**සැළකිය යුතුයි :**

අදාළ ආකෘතියට අනුව පමණක් අයදුම්පත්‍රය සම්පූර්ණ කර එවිය යුතු අතර ඔබගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතිකපත්‍රවල පිටපත් අයදුම්පත්‍රය සමග යොමු කළ යුතු වේ.